# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

GJRTI

## (මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය)

# පුරප්පාඩු

**මැ.හා ස්ව. පර්. හා අභ්‍යාස ආයතනය සුදුසුකම් හා පළපුරුද්ද ලත් අයදුම්කරුවන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත් ) - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

   (අදාළ විෂය ක්ෂේත්‍රයේ විශේෂ උපාධියත් ඇති අය සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) **සහ**

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් පරිමාණය :**

MM 1-1 2016

රු. (53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575) + රජයේ අනුමත දීමනා, E.P.F 15%, E.T.F 3%

**වයස :** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපායි.

**සෑම අයදුම්කරුවෙකුම :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය :**

(1) මේ සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අධ්‍යාපන / වෘත්තිමය සහ අනෙකුත් සහතික වල සහතික කරන ලද පිටපත් සමග ඔබගේ ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) විස්තර සඳහන් සම්පූර්ණ කරන ලද ජීව දත්ත සටහනක් යොමු කළ යුතුය.

(2) ඉහත (1) හි සඳහන් අවශ්‍ය ලේඛණ අමුනා නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(3) අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ සඳහන් කොට XX.12.2021 දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

(4) දැනට රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන වල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුවේ.

(5) සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය,**
**"රුවන් සෙවණ", අංක 73/5/A, වැලිවිට, කඩුවෙල.**
**දු.ක: 0114-324 679 0112-579187**